බස්නාහිර පළාත් සභාවේ

2007 අංක 03 දරණ

මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය

නම් වූ

මෙම ප්‍රඥප්තිය

2007.06.05 දින පැවති

බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීමේදී

සභා සම්මත වූ බව

සහතික කරමි.

දිනය 2007/07/20

ජගත් අංගගේ
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

ජගත් අංගගේ
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

දිනය: 3/8/2007

එස්. අලවි මව්ලානා
බස්නාහිර පළාතේ
ආණ්ඩුකාරවර

එස් අලවි මව්ලානා
ආණ්ඩුකාරවර
බස්නාහිර පළාත.

# 2007 අංක ..03....දරණ බස්නාහිර පළාත්
# මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය

බස්නාහිර පළාත් සභාවේ 1995 අංක 7 සහ 1993 අංක 3 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය මගින් සංශෝධිත, 1992 අංක 01 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

බස්නාහිර පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය බස්නාහිර පළාත් සභාවේ 2007 අංක ..03.....දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන 1992 අංක 01 දරණ බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වගන්තිය සංශෝධනය කිරීම

(අ) 30 (1) හා 30 (2) වගන්ති ඉවත් කරනු ලැබීමෙන් හා ඒ වෙනුවට මතු සඳහන් වගන්ති ආදේශ කිරීමෙන් ;

රීති සෑදීමට පළාත් අමාත්‍යවරයාට බලය ඇතිබව

30 (1) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමේ සහ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහාද, මගී ප්‍රවාහන සමාගම්වල සේවයේ යෙදෙන සියළු සේවකයින්ට සහ පෞද්ගලික බස් ධාවනය හා සම්බන්ධ සේවයේ යෙදෙන සියළු සේවකයින්ට අදාල අවම වැටුප්, නිවාඩු සහ සේවක වරප්‍රසාද නියම කිරීමේ කාර්යය සඳහා ද, ගාස්තු අයකර ගැනීම සඳහා විධිවිධාන සළසනු පිණිසද, මෙම ප්‍රඥප්තිය මගින් නියමිත හෝ මේ ප්‍රඥප්තියෙන් බලය පවරා ඇති සියලු කාරණා සඳහාද පළාත් විෂයය භාර අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැක්කේය.

(2) විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පල කරනු ලබන දින සිට මාය තුනක් ඇතුලත සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් රීතියක්, එහි අනුමත නොවූ දිනයේ සිට, එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(3) විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් රීතියක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ හෝ අනුමත කරනු ලැබූ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ මසක් ඇතුලත පළ කරනු ලැබිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම

(ආ) 32 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් වගන්ති ආදේශ කිරීමෙන් ;

වැරදි හා දණ්ඩන

32(1) අධිකාරිය සතු කිසියම් ඉඩමකට හෝ ගොඩනැගිල්ලකට පූර්ව අනුමැතියකින් තොරව ඇතුල්වීම, එහි සන්තකය දැරීම හෝ පරිහරණය කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක්වේ.

(2) මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක්, ඒ යටතේ සාදන ලද හෝ දෙන ලද යම් රීතියක්, නියමයක්, විධානයක් හෝ නියම කිරීමක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින සෑම තැනැත්තෙක්ම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීම හෝ එම දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

එස්. අලවි මවලානා
බස්නාහිර පළාතේ
... ආණ්ඩුකාරවර